

සංවර්ධනය
භූගෝල විද්‍යාව
11 ශ්‍රේණිය
M.R.M.මාහර
කෑ/දෙහි/ මියනවිට ක.වි.
දැරණියගල

# සංවර්ධනය යනු ?

- ගතික සංකල්පයකි. එනම් වෙනස්වන සුළුය.
- සාක්ෂාත් කරගෙන අවසන් කළ නොහැකි අඛණ්ඩ කියාදාමයකි.






# සංවර්ධනය පිළිබඳ නිර්වචන

- රටක දිළිඳු බව අවසන් වී, සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා වැඩි වී, ආදායම් බෙදී යාමේ විෂමතා ඉවත් වේ නම් එය සංවර්ධනයයි.

ඩඩ්ලි සියර්ස්



- සංවර්ධනය යනු ලෝක ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමයි.

පළමුවන සංවර්ධන දර්ශකය - 1996-70 එ.ජා. සංවිධානය





- රටක ආර්ථික සංවර්ධනය සමඟ සමාජයීය සංවර්ධනයක් ද ඇතිවිය යුතුය . සමාජයීය සංවර්ධනය සිදුවිය යුත්තේ ආහාර හා පෝෂණය , සෞඛ්‍ය හා අධ්‍යාපනය, නිවාස, සමාජ සුරක්ෂිතතාව, ඇඳුම් පැළඳුම්, විවේකය හා මානුෂික නිදහස යන ක්ෂේත්‍ර වලය.

1978 - යුනෙස්කෝ ප්‍රකාශය

- සංවර්ධනය යනු ජනසංඛ්‍යාව සමාජයීය, සංස්කෘතික හා සදාචාරාත්මක යන සාධක ඇතුළත් වෙනස්වීම් හා වර්ධනය පිළිබඳ ක්‍රියාදාමයකි.

1981/90 එක්සත් ජාතීන්ගේ සංවිධානය

සංවර්ධනය කාලීනව වෙනස්වන සංකල්පයක් නිසා සංවර්ධනය මැනීමට ද කලින් කලට විවිධ මිනුම් ඉදිරිපත් වී ඇත.

- 70 දශකයේ - ආර්ථික නිර්ණායක පමණක් සංවර්ධනය හැඳින්වීමට යොදාගන්නට විය. නිෂ්පාදන ප්‍රමුඛ වීම.
- 70 දශකයෙන් පසු- ආර්ථික නොවන නිර්ණායක කෙරෙහි හා සමාජ උන්නතිය කෙරෙහි අවධානය යොමුවිය.
- 80 දශකයේ - පරිසරයේ ගුණාත්මක වබ පිරිහෙන්නට විය.

  කර්මාන්ත ඇතිවීම,

  කෘෂි ආර්ථිකය ⟶ කාර්මික ආර්ථිකය,

  ලෙඩරෝග ඇතිවීම.

  පරිසර දූෂණය

  මේ නිසා පරිසර ආරක්ෂාව හා සංරක්ෂණය ද

- 90 දශකයේ -පරිසරයේ ගුණාත්මක බව පිළිබඳ අවධානය වැඩි වන්නට විය.
- තිරසාර සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු විය. ආර්ථික, සමාජ හා පරිසරය යන අංශ සංවර්ධන සංකල්පයට එකතු වන්නට විය.

# සංවර්ධනය මැනීමට යොදාගත් මුල්කාලීන මිනුම්

- ඒක පුද්ගල ආදායම
- ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය
- දළ දේශීය නිෂ්පාදිතය
- මිනිසුන් දහසකට ඇති ගුවන්විදුලි සංඛ්‍යාව
- මිනිසුන් දහසකට ඇති දුරකථන සංඛ්‍යාව




***<u>දළ දේශීය නිෂ්පාදිතය යනු,</u>***

රටක සිටින සියලුම ජනතාව හා සමාගම් විසින් නිපදවනු ලබන අවසන් භාණ්ඩ හා සේවාවල වටිනාකම යි.

# 20 වන සියවස අග දී භාවිතා වූ මිනුම්

- ළදරු මරණ අනුපාතය
- මාතෘ මරණ අනුපාතය
- සාක්ෂරතාවය
- උපතේ දී ආයු අපේක්ෂාව
- ආදායම් විෂමතා ඉවත්වීම
- තොරතුරු සන්නිවේදන අවස්ථා
- අධ්‍යාපන අවස්ථා පුළුල් වීම
- දේශපාලන තීරණ ගැනීමේ නිදහස
- භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව

# සංවර්ධන මිනුම්

- එකිනෙක රටවල සංවර්ධනය මැනීමට විවිධ මිනුම් යොදා ගනී .
- විවිධ ආයතන , සංවිධාන , පුද්ගලයන් මේ සඳහා මිනුම් හඳුන්වා දී ඇත.

## සංවර්ධන මිනුම්

| පැරණි මිනුම් | නූතන මිනුම් |
|---|---|
| මූර්ත දළ ජාතික නිෂ්පාදිතය | භෞතික ජීවන තත්ත්ව දර්ශකය PQLI |
| ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය | මානුෂ සංවර්ධන දර්ශකය HDI |
| දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය | මානුෂ දරිද්‍රතා දර්ශකය HPI |
| | මානුෂ පීඩක දර්ශකය HIS |

# මානුෂ සංවර්ධන දර්ශකය


- මුල් කාලයේ පැවති මිනුම් වලින් සංවර්ධනයේ යථාර්තය එළි දැක්වීමක් සිදු නොවුනි.
- ඒවා දියුණු, මධ්‍යම සහ අඩු යන සංවර්ධන මට්ටම් හැඳිනීමට පමණක් සීමා විය.
- මෙය තව දුරටත් වැඩිදියුණු වී සංවර්ධනය මැනීමට යොදා ගන්නට විය.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ මෙය හඳුන්වා දෙන්නට විය.
- මෙමඟින් සංවර්ධනයේ යථාර්ථය හඳුනාගත හැකිවිය.

# මානුෂ සංවර්ධන දර්ශකය මැනීමට යොදාගත් නිර්ණායක

- 1. උපතේ දී ආයු අපේක්ෂාව
- 2. සාක්ෂරතාවය
- 3. ක්‍රයශක්තිය හා ගැළපු ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය



- මෙහි අගය 0 සිට 1 දක්වා විහිදේ.
- මෙම අගය අනුව ලොව රටවල් සංවර්ධන කාණ්ඩ 4ක් යටතේ හඳුනා ගනු ලැබේ.
  - ඉතා ඉහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්
  - ඉහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්
  - මධ්‍යස්ථ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්
  - පහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්




| Top Ten | | Bottom Ten | |
|---|---|---|---|
| **Rank** | **Country** | **Rank** | **Country** |
| 1 | Norway | 168 | Dem. Rep. of Congo |
| 2 | Sweden | 169 | Central African Rep. |
| 3 | Australia | 170 | Ethiopia |
| 4 | Canada | 171 | Mozambique |
| 5 | Netherlands | 172 | Guinea-Bissau |
| 6 | Belgium | 173 | Burundi |
| 7 | Iceland | 174 | Mali |
| 8 | United States | 175 | Burkina Faso |
| 9 | Japan | 176 | Niger |
| 10 | Ireland | 177 | Sierra Leone |

- ශ්‍රී ලංකාව මානුෂ සංවර්ධන දර්ශකයේ 72 වන ස්ථානයේ පසුවේ.

## Miles to go

Though India improved its absolute value of the Human Development Index (0.645 in 2019 from 0.642 the previous year), it dropped a place in the overall ranking

| Country | HDI rank (2019) | Change from 2018 |
|---|---|---|
| Russia | 52 | -3 |
| Sri Lanka | 72 | 1 |
| Brazil | 84 | 0 |
| China | 85 | 2 |
| South Africa | 114 | 1 |
| **India** | **131** | **-2** |
| Bangladesh | 133 | 1 |
| Nepal | 142 | 1 |
| Pakistan | 154 | 0 |

# භෞතික ජීවන තත්ත්ව දර්ශකය

## Indicators of P.Q.L.I

- Physical Quality of Life Index (P.Q.L.I) was developed by famous economist Morris David in 1979 for 23 developed and developing countries.
- Morris David used the following three indicators to prepare a composite index known as Physical Quality of Life Index:

Life Expectant Rate (L.E.I)



Infant Mortality Rate (I.M.I)



Basic Literacy Rate (B.L.I)




# මානුෂ දරිද්‍රතා දර්ශකය



| | Human Poverty Index for developing countries | Human Poverty Index for selected OECD countries |
|---|---|---|
| A long and healthy life | • Probability at birth of not surviving to age 40 | • Probability at birth of not surviving to age 60 |
| Knowledge | • Adult literacy rate | • % of adults lacking functional literacy skills |
| A decent standard of living | • % of population not using an improved water source<br>• % of children under-weight for age<br>• Deprivation of a decent standard of living | • % of people living below the poverty line |
| Social exclusion | Not included as a dimension | • Long-term unemploy-ment rate |

**FIGURE 12–8** The Human Poverty Index

# මානුෂ පීඩක දර්ශකය



# තිරසර සංවර්ධනය

- ජනසංඛ්‍යාවේ වර්ධනය සමඟ විවිධ සංවර්ධන වැඩපිළිවෙල් ඇතිවන්නට විය.
- විධිමත් පාලනයකින් තොරව සිදු වූ මෙම ක්‍රියාකාරකම් පරිසරයට මෙන්ම මිනිසාට ද අහිතකරව බලපාන ලදී.
- මේ නිසා පාරිසරික විසන්තුලනය වැළැක්වීම සහ පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කර ගැනීමට තිරසර සංවර්ධනය කෙරේ අවධානය යොමු විය.

## තිරසර සංවර්ධනයේ අරමුණ :


- සංවර්ධන ක්‍රියාවලියේදී පරිසර කළමනාකරණය සහ සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීම.
- සියලුම රටවල් පරිසරය සුරැකීමේ ක්‍රියාදාමයට සෘජුව ම දායක වීම.


# සංවර්ධනය සමඟ ඇතිවන පරිසර ගැටළු






# සංවර්ධනයේ ප්‍රතිවිපාක




රුසියාවේ මහල් නිවාස සංකීර්ණයක්
සංවර්ධනය සිදු විය යුත්තේ මෙලෙස නොවේද


පරිසර විනාශයෙන් තොර
සැබෑ සංවර්ධනය
THE WAVE
සදහා හොදම උදාහරණය



# තිරසාර සංවර්ධන අරමුණු.....



# ශ්‍රී ලංකාවේ මෑතකාලීන සංවර්ධන ක්‍රියා මාර්ග

අතීතයේ...

- ගොවිජනපද ව්‍යාපාර
- ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාර
- බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම
- නිදහස් වෙළෙඳ කලාප
- අපනයන ගම්මාන ආරම්භ විය.






# වර්තමානයේ....

- යටිතල පහසුකම් දියුණු කිරීම.
- ගුවන් තොටුපල
- අධිවේගී මාර්ග
- වරාය
- දුම්රිය මාර්ග
- නාගරික සංවර්ධනය
- ග්‍රාමීය සංවර්ධනය
- අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම්
- සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය
- ජාතික ආරක්ෂාව



# යටිතල පහසුකම් දියුණු කිරීමේ ප්‍රයෝජන

- රටේ නව ප්‍රදේශ සංවර්ධනයට විවෘත වීම.
- වෙළඳපල පුළුල් වීම
- නව නිෂ්පාදන කඩිනමින් වෙළෙඳපලට ලැබීම.
- මගී හා භාණ්ඩ සංචලනය වේගවත් වීම
- අභ්‍යන්තර සංක්‍රමණ රටාව වෙනස්වීම.
- නව රැකියා අවස්ථා බිහිවීම.
- භෞතික දුර අඩුවීමෙන් කාලය ඉතුරු වීම.



යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් 5.1 කටත් වඩා වැඩිය

# මහාමාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධනය

## මහාමාර්ග

අධිවේගී මාර්ග ( ජාතික මහා මාර්ග )

A හා B ශ්‍රේණියේ මාර්ග ( ජාතික මහා මාර්ග )

C හා D ශ්‍රේණියේ මාර්ග ( පළාත් මහා මාර්ග )

වර්ග නොකළ මාර්ග ( ප්‍රාදේශීය අධිකාරී මාර්ග)

සෙසු මාර්ග ( රාජ්‍ය අංශයේ ආයතන)




# මහාමාර්ග සංවර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග

- ප්‍රාදේශීය විෂමතා අවමයට සහ ආර්ථික ක්‍රියාකාරකම් දියුණු කර ගැනීමට මාර්ග සංවර්ධනය ඉතා වැදගත් වේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අවශ්‍යතාවයෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් ජාතික මහා මාර්ග මඟින් සපුරාලනු ලැබේ.
- 2015 - මාර්ග සංවර්ධන අධිකාරිය නඩත්තු කරන ලද මාර්ගවල මුළු දිග ප්‍රමාණය කිලෝමීටර් 12,380කි.
- මාර්ග සංවර්ධනය සඳහා 2014- රු.බි. 120.9

  2015 - රු.බි. 144.6 වැය වී ඇත.
- උතුරු ප්‍රදේශවල මාර්ග ප්‍රතිසංස්කරණය. (යාපනය, පුනරීන්, මාන්කුලම් ) උතුරු වසන්තය / නැගෙනහිර නවෝදය ව්‍යාපෘති මඟින්
- අධිවේගී මාර්ග ඉදිකිරීම.

- උමං මාර්ග ඉදිවීම. (රම්බොඩ / කඩවත)
- පාලම් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය.
- මගී ප්‍රවාහනය සඳහා නවීන පහසුකම්වලින් යුතු බස්රථ යෙදවීම.
- පවතින මහාමාර්ග පුළුල් කිරීම සහ කාපට් ඇතිරීම.
- ගුවන් පාලම් ඉදිකිරිම .
- අනවසර පදික ඉදිකිරීම් ඉවත් කිරීම.
- 2015 මංතීරු නීතිය බලාත්මක කිරීම.




# දුම්රිය මාර්ග

- ශ්‍රී ලංකා දුම්රිය සේවය 2015 වසර තුළ දී යම් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.
- සාපේක්ෂ අඩු ගාස්තු සහ උතුරු පළාත දක්වා දුම්රිය සේවා පුළුල් කිරීම නිසා දුම්රිය මගී කිලෝමීටර ප්‍රමාණය 2014- කි.මී. බිලියන 6.8

  2015- කි.මී.බිලියන 7.4 කින් ඉහළ ගියේය.

- කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පවතින අධික වාහන තදබදය ද මීට හේතුවන්නට ඇත.
- දුම්රිය ස්ථානවල දුම්රිය වේදිකා, මගී පාලම්, වහල ප්‍රතිසංස්කරණය අඛණ්ඩව සිදු කිරීම.
- උතුරු දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් නිම කිරීම.
  - මඩු - තලෙයිමන්නාරම- යාපනය - කන්කසන්තුරේ

- දක්ෂිණ දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීම.
- කැළණි වැලි මාර්ගය පුළුල් කිරීම.
- මාතර - කතරගම දුම්රිය මාර්ගයේ දික්වැල්ල දක්වා වැඩ කටයුතු ආරම්භ කිරීම.



# ගුවන්තොටුපළ හා වරාය සංවර්ධනය

## ගුවන්තොටුපළ සංවර්ධනය.

ශ්‍රී ලංකාවේ දැකිය හැකි ගුවන්තොටුපළවල්:

- කටුනායක
- මත්තල
- සීගිරිය
- කොග්ගල
- රත්මලාන
- මඩකලපුව
- අම්පාර
- පලාලි
- ත්‍රිකුණාමලය

- අභ්‍යන්තර සහ  ජාත්‍යන්තර වශයෙන් ගුවන් ගමන් සිදුවේ.
- ශ්‍රී ලංකාව ගුවන් කේන්ද්‍රයක්ව වර්ධන කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක් සිදුවේ.
- කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ නවීන පහසුකම් සහිතව වැඩිදියුණු කිරීම.






- මත්තල ගුවන්තොටුපළ අලුතින් ඉදිකිරිම.
- රත්මලාන නාගරික ගුවන්තොටුපළක් බවට පත් කිරීම.
- පලාලි ජාත්‍යන්තර ගුවන්තොටුපළක් බවට පත් කිරීම.
- හදිසි අවශ්‍යතා සහ සේවා පහසුකම් සැපයිය හැකි මද්‍යස්ථාන ලෙස කටුනායක සහ මත්තල ගුවන්තොටුපළවල් දියුණු කිරීම.
- ගුවන්තොටුපළවල් ආශ්‍රිතව දුම්රිය , ප්‍රවාහන පහසුකම් සහ අනිකුත් යටිතල පහසුකම් වර්ධනය කිරීම.
- අභ්‍යන්තර ගුවන්තොටුපළවල් සංවර්ධන කිරීම.

# වරාය සංවර්ධනය

## ශ්‍රී ලංකාවේ වරාය සංවර්ධනයට ප්‍රමුඛතාව දීමට හේතු....

- ආනයන අපනයන කටයුතු සිදුකිරීම.
- ප්‍රති අපනයන කටයුතු සිදුකිරීම.
- සේවා සැපයීම.
- අලුත්වැඩියා කටයුතු හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.
- කඩිනම් හා කාර්යක්ෂම ලෙස බහාලුම් මෙහෙයවීම.



# මෑතකදී සංවර්ධනය කරනලද වරායන්

- ගාල්ල
- ඔලුවිල්
- කොළඹ
- මාගම

මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය නවීන අංගෝපාංග සහිතව ඉදිකිරීම.

ප්‍රතිඅපනයන

ඉන්ධන ගබඩාව

නැව් වලට ඉන්ධන , ජලය සැපයීම.

වාහන අංගන , බහාලුම් පර්යන්ත



- ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මුහුදු සේද මාවතේ කේන්ද්‍රගතව පිහිටීමේ වැදගත්කම හඳුනාගෙන බහාලුම් ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රතිඅපනයන මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.



- කොළඹ වරාය නගරය ආශ්‍රිතව නිවාස සංකීර්ණ , සාප්පු සංකීර්ණ, හොටෙල් සංකීර්ණ , සේවා මධ්‍යස්ථාන ආදියෙන් සමන්විත පරිදි සැකසීමට සැලසුම් කිරීම
- වියළි තටාංගන පහසුකම් වැඩිදියුණු කිරීම.

වරාය නගරය





# මානව සම්පත් සංවර්ධනය

- රට සංවර්ධන කිරීමේ දී වැදගත්ම සම්පත වන්නේ මිනිසාය.

- මන්ද මිනිසා බුද්ධිය හා කුසලතා මඟින් පරිසරයේ සම්පත් උපයෝගී කරගෙන නව නිර්මාණ හා නිෂ්පාදන සිදු කරන බැවිනි.

- මේ නිසා මිනිසාගේ කායික, මානසික කුසලතා මෙන්ම ආධ්‍යාත්මික ගුණවගාවක් ඇති වන පරිදි මානව සම්පත සංවර්ධන කළ යුතුය.



- ශ්‍රී ලංකාව අතීතයේ සිටම මානව හිතවාදී රටකි.

- අධ්‍යාපනය, සෞඛ්‍යය හා ආරක්ෂාව නොමිලේ ලබාදෙන අතර සහන සේවා යටතේ දුම්රිය, මෝටර් රථ ප්‍රවාහනය වැනි සේවාවන් ද තෝරා ගත් පිරිස් සඳහා ලබා දේ.

- පොදු සේවා පහසුකම් නොමිලේ ලබා දීම හේතුවෙන් ශ්‍රී ලංකාව සුභසාධක රාජ්‍යයක් ලෙස ද හැඳින්වේ.

……මානුෂ සංවර්ධනයට ගත් ක්‍රියාමාර්ග:

- ජනසවිය
- සමෘද්ධිය
- දිවිනැගුම
- ස්වයං රැකියා අවස්ථා
- නිවාස ලබා දීමේ ව්‍යාපෘති

# අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය

- මානව සංවර්ධනයේ දී අවධානය යොමු කෙරෙන වැදගත් ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යාපන සංවර්ධනය දැක්විය හැකිය.

- රට තුළ වේගවත් වර්ධනයක් හා සංවර්ධනයක් ලබා ගැනීමට ප්‍රාථමික , ද්විතියික ,තෘතියික ආදී සියලු අධ්‍යාපන මට්ටම්වල අඛණ්ඩ වර්ධනය අත්‍යවශ්‍ය වේ.

- මෙහි දී *සැමට අධ්‍යාපනය ලබා දීම ,*

  *අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම,*

  *වෙනස්වන ශ්‍රම වෙළෙඳපළට ගැළපෙන සේ අධ්‍යයන අවස්ථා සැලසීම .*

කෙරේ විශේෂ අවධානය යොමු වී ඇත.

- රජය රටේ ප්‍රධාන අධ්‍යාපන සැපයුම්කරුවා ලෙස සිය කාර්යභාරය අඛණ්ඩව පවත්වාගෙන යන අතර අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ යෝජනා ද සැළකිය යුතු මට්ටමින් වැඩි වී ඇත.
- පෞද්ගලික අංශයේ අධ්‍යාපනය වර්ධනය වීම මඟින් රාජ්‍ය අංශය මඟින් ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමය තුළ පවතින විවිධ පරතරයන් පිරවීමට අවකාශය ලැබී ඇත.
- සමස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ මූලික තේමා 03කි.
  - ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා සර්ව සාධාරණ ප්‍රවේශය ඉහළ නැංවීම.
  - ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
  - අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සේවා සැපයුම හා යහපාලනය ශක්තිමත් කිරීම.

- ✓ සැමට සමාන අධ්‍යාපනය ලබාදීම. ( ළඟම පාසල හොඳම පාසල )
- ✓ අනිවාර්ය අධ්‍යාපනය ලබාදීම ( 1-13 ශ්‍රේණි දක්වා )
- ✓ ශිෂ්‍යාධාර ලබාදීම. ( මහපොළ, සුජාත දියණි )
- ✓ නවීන විද්‍යාගාර පහසුකම් පාසල්වලට ලබාදීම.
- ✓ කාර්මික විද්‍යාල ඇතිකිරීම.
- ✓ තාක්ෂණික විශ්ව විද්‍යාල ඇතිකිරීම. ( ශ්‍රී ජයවර්ධනපුර වි.වි.)
- ✓ පාසැල් හැරයන්නන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇතිකිරීම.
- ✓ උසස් පෙළ සඳහා තාක්ෂණික විෂයන් හඳුන්වා දීම.
- ✓ දෙමළ මාධ්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම.
- ✓ ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය ශක්තිමත් කිරීම.
- ✓ විෂයමාලා ප්‍රතිසංස්කරණ
- ✓ රක්ෂණ ක්‍රමය හඳුන්වාදීම ( සුරක්ෂා )


අධ්‍යාපන අමාත්‍යාංශය
ළඟම පාසල
හොඳම පාසල
ගුණ නැණ බල සවිරි සිසු පරපුරක් උදෙසා
ජාතික වැඩසටහන
2016 - 2020



# වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන

- කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව
- වෘත්තීය පුහුණු අධිකාරිය
- ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

## එම ආයතන මඟින් ලබාදෙන පාඨමාලා

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය
- ඉදිකිරීම්
- මෝටර් රථ නඩත්තුව
- රෙදිපිළි හා ඇඟලුම්
- හෝටල් සහ සංචාරක
- නිර්මාණකරණය සහ මාධ්‍යකරණය
- කාර්යාල කළමනාකරණය



- උසස් පෙළ සමතුන්ට ප්‍රවීණතා විභාගයක් පවත්වා එහි ලකුණු මත ඇතුළත් වීමට නව විශ්ව විද්‍යාල ආරම්භ කිරීමට සැලසුම් කිරීම. ( කළුතර / නුවරඑළිය/ මාතලේ/ හම්බන්තොට සහ මුලතිව් )



**පාසල් දත්ත 2017**

| | |
|---|---|
| මුළු පාසල් ගණන | 10,194 |
| 1AB පාසල් ගණන | 1029 |
| 1C පාසල් ගණන | 1818 |
| 2වර්ගයේ පාසල් | 3288 |
| 3 වර්ගයේ පාසල් | 4059 |

*ජාතික පාසල් ගණන 353
*පළාත් සභා පාසල් ගණන 9841
*1 ශ්‍රේණියට ඇතුලත්වීම් 322135

**භාෂා මාධ්‍යය අනුව පාසල්**

| | |
|---|---|
| සිංහල පමණක් පාසල් | 6332 |
| දෙමළ මාධ්‍ය පමණක් | 3009 |
| සිංහල හා දෙමළ මාධ්‍ය | 75 |
| සිංහල හා ඉංග්‍රීසි | 558 |
| දෙමළ හා ඉංග්‍රීසි | 173 |
| සිංහල,දෙමළ,ඉංග්‍රීසි | 47 |

# සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය

- නිරෝගී ජනතාවක් බිහි කරගැනීම සංවර්ධන කාර්යයේ දී අත්‍යවශ්‍ය වේ.

- නිරෝගී මනසක් සහ නිරෝගී සිරුරක් ඇති අය අධ්‍යාපනයේ ප්‍රතිලාභ උරුම කරගැනීමට සමත්වන අතර ඔවුන් සංවර්ධන කාර්යයට යොමු කිරීම පහසු වේ.

- එමෙන්ම වෙනස් වීමට, වෙනස්වීම් දරාගැනීමට හා ප්‍රතිලාභ විඳ දරා ගැනීමට ඔවුහු සමත් වෙති.

- *ඒ අනුව සෞඛ්‍යය සේවා පුළුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග….*

  - ග්‍රාමීය රෝහල්වල පහසුකම් වැඩිදියුණු කිරීම.
  - රෝහල් කාර්යය මණ්ඩලය වැඩි කිරීම.
  - වෛද්‍ය විද්‍යාලවලට බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩි කිරීම.

- රෝග නිවාරණ වැඩසටහන් හඳුන්වා දීම.
- ප්‍රජා මුල සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආයුර්වේද වෙදකම ප්‍රචලිත කිරීම (
- ළදරු/ ළමා / මාතෘ/ වැඩිහිටි සායන පහසුකම් වැඩිදියුණු කිරීම.
- පාසල් , කාර්යාල , සමිති සමාගම් ආදී ආයතන මුල්කරගෙන ජංගම සායන පුළුල් කිරීම.
- යහපත් සෞඛ්‍ය පුරුදු පිළිබඳ දැනුවත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍යයට හිතකර නොවන මහජන ක්‍රියාකාරකම් වැළක්වීමට කටයුතු කිරීම.



# ප්‍රාදේශීය සංවර්ධනය

- විවිධ ප්‍රදේශවල කේන්ද්‍රගතව ඇති සම්පත්, සහ භෞතික පරිසරය ප්‍රයෝජනයට ගනිමින් , විෂමතාව අවම වන පරිදි මානුෂ සුභසාධනයට කටයුතු කිරීම මෙහි මුලික අරමුණ වේ.
- සංවර්ධනයේ පහසුව උදෙසා පරිපාලන ධුරාවලි කිහිපයකට බෙදා දක්වා ඇත.

ගම

↓

ග්‍රාම සේවා කොට්ඨාසය

↓

දිස්ත්‍රික්කය

↓

පළාත

## *ප්‍රාදේශීය සංවර්ධනය අවශ්‍ය ඇයි?*

- බස්නාහිර පළාතට සාපේක්ෂව අනිත් සැම පළාතක්ම දළ ජාතික නිෂ්පාදනයට ඇති දායකත්වය ඉතා අවම මට්ටමක පැවතීමයි..

## ප්‍රාදේශීය සංවර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග

### *ගම සංවර්ධනයට*

- ග්‍රාමීය නිවාස වැඩසටහන් ආරම්භ කිරීම.
- ග්‍රාමීය මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම.
- ග්‍රාමීය විදුලි ව්‍යාපෘති ඇති කිරීම.
- ප්‍රජා මූලික ජල ව්‍යාපෘති ඇති කිරීම.
- ස්වයං රැකියා දියුණු කිරීමට ආධාර , උපදෙස් ලබා දීම.



# නගරය සංවර්ධනයට

- නාගරික ප්‍රදේශවල මාර්ග පුළුල් කිරීම.
- අනවසර ඉදිකිරීම් ඉවත් කිරිම.
- නගර අලංකරණය
- නාගරික පරිසරය තුළ විනෝදය , විවේකය ලබා ගැනීමේ අවස්ථා පුළුල් කිරීම.
- පැල්පත් ඉවත් කර නව නිවාස සංකීර්ණ ඉදිකිරිම.
- නව වෙළෙඳ සංකීර්ණ ඉදිකිරිම.
- කසළ කලමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පොදු සේවා මධ්‍යස්ථානවල පහසුකම් වැඩි කිරීම.



# දැනුම පදනම් කරගත් සංවර්ධනය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය

*තොරතුරු සන්නිවේදන තාක්ෂණය යනු*



විවිධ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු රැස්කිරීම.

ගබඩා කිරීම.

විශ්ලේෂණය කිරීම හා

හුවමාරු කරගැනීම සඳහා පවතින සේවාවකි.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණයේදී අපට වඩාත් වැදගත් වන්නේ විද්‍යුත් මාධ්‍යයි.
- මේ නිසා පහසුවෙන් හා වේගවත්ව තොරතුරු 100%ක් නිරවද්‍යතාවයකින් අනිත් අයටලබා දීමට හැකියාව ඇත.

- සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීමේ, අවශ්‍ය පරිදි සකස් කිරීමේ හා නැවත ලබාදීමේ කාර්යයේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ යෙදීම් බහුලව යොදා ගනී.



# තොරතුරු සන්නිවේදන තාක්ෂණය මඟින් ලැබී ඇති පහසුකම්

- <u>රටේ ජාත්‍යන්තර හා අභ්‍යන්තර සබඳතා වැඩි දියුණු වීම.</u>
  - අනිකුත් රටවල්වල සිදුවන සිදුවීම් දැනගැනීමට. නිදසුන්: *කොරෝනා වෛරසය*
  - ලෝක වෙළඳපොළේ භාණ්ඩ මිල උච්චාවචන පිළිබඳ දැනගැනීමට.
  - ගැටළුකාරී , අපදා අවස්ථාවල දී ආධාර සැපයීමට.
  - වෙනස්වන තොරතුරු සමඟ යාවත්කාලීන වීමට.

- <u>අධ්‍යාපනය සඳහා නව මංපෙත් විවර වීම.</u>
  - නව ඉගෙනුම් උපකරණ හඳුන්වා දීම.
  - විද්‍යුත් මාධ්‍ය මඟින් අධ්‍යාපන වැඩසටහන් විකාශය කිරීම


    නැණස, e තක්සලාව,

- ඔන්ලයින් ක්‍රමයට ඉගැන්වීම.
- පරිගණක භාවිතයෙන් ඉගෙනගැනීම.
- උසස්පෙළ සඳහා තාක්ෂණ විෂය ධාරා හඳුන්වාදීම.
- විවිධ ඉලෙක්ට්‍රොනික් උපාංග අධ්‍යාපනය සඳහා යොදාගැනීම.(අන්තර් ක්‍රියාකාරී සුදු පුවරුව, මල්ටි මිඩියා,ප්‍රොජෙක්ටර් )
- වීඩියෝ සාකච්ඡා





- වෙබ් අඩවි භාවිතයෙන් ඉගෙන ගැනීම.
- ඉගෙනුම් කළමනාකරණය පද්ධති සැකසීම.



- සෞඛ්‍යය
  - පර්යේෂණ සහ නව සොයාගැනීම් සිදුකිරීම.

නිදසුන්: චුම්බක අනුනාදන මූර්තන යන්ත්‍රය ( MRI ) රේඩියෝ තරංග සහ චුම්භක අනුනාදන මඟින් සිරුරේ අභ්‍යන්තර කොටස්වල රූප ලබාගැනීම.




# ECG විද්‍යුත් තන්තු රේඛිය යන්ත්‍රය

හෘද ස්පන්දනය නිරීක්ෂණය කිරීමට

දුරස්ථ සෞඛ්‍යය රැකවරණය

- රෝගියෙකුට නිවසේ සිටම ප්‍රතිකාර ලැබීමට අවකාශය ලැබීම.



## ❑ කෘෂිකර්මාන්තයේදී

- ගොවිතැනට තාක්ෂණය යොදාගැනීම.
  - කාලගුණික මිනුම් යන්ත්‍ර යොදාගැනීම.
  - ස්වයංක්‍රිය කුරුමිණි පාලන යන්ත්‍ර
  - ස්වයංක්‍රිය ජල සැපයුම් යන්ත්‍ර
  - රොබෝ තාක්ෂණයෙන් පැල සිටුවීම,අස්වනු නෙලීම.



රූපය 1.36 - ස්වයංක්‍රීය කුරුමිණි පාලන යන්ත්‍රය

## ❑ කර්මාන්ත සඳහා

- ✓ නවීන උපකරණ මෙවලම් හා යන්ත්‍ර සුත්‍ර භාවිතය
- ✓ ස්වයං රැකියා සඳහා තාක්ෂණ විධි භාවිතය
- ✓ කාර්යාල කටයුතු පහසු වීම.
- ✓ online රැකියා අවස්ථා ඇතිවීම.



රූපය 1.40 - රොබෝ තාක්ෂණයෙන් පැළ සිටුවීම

- ආපදා අවස්ථා වලට සාර්ථකව මුහුණ දීම සඳහා
- ආපදා ඇතිවීම කලින්ම හඳුනාගැනීමට .( සුනාමි, නායයාම්, භූමිකම්පා)
- බැංකු කටයුතු කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා ( ATM, CREDIT cads, e banking)

මේ මඟින් ගනුදෙනු ඉක්මන් වීම සහ සුරක්ෂිත වීම ද සිදුවේ.

- සාමාන්‍ය ජනතාවගේ සේවා අවශ්‍යතා සපුරා ගැනීමට අවස්ථාව ලැබීම. දැනුම පුළුල් කරගැනීමට හැකිවීම.

තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ සේවා පහසුකම් ලබා ගැනීමට පුද්ගලයාට දැනුමක් තිබිය යුතුය. (මෙවලම් භාවිතය, සුදුසු දේ තෝරා ගැනීම.)

- මේ සඳහා මූලික අධ්‍යාපනය
- තාක්ෂණික මෙවලම් හැසිරවීම
- දත්ත රැස්කිරීම, ගබඩා කිරීම, විශ්ලේෂණය, සන්නිවේදනය ආදී පියවර පිළිබඳ දැනුවත් විය යුතුය

# තොරතුරු සන්නිවේදන තාක්ෂණ පිළිබඳ දැනුම ලබාගත හැකි මූලාශ්‍ර

- නැණසල හා ඊ ශ්‍රී ලංකා වැඩපිළිවෙළ
- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය
- විදුලි සංදේශ කොමිසන් සභාව
- 2013- උසස්පෙළ තාක්ෂණික විෂය ධාරාව
- විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
- පාසල් පද්ධතියට අන්තර්ජාල පහසුකම් තොරතුරු සන්නිවේදන ඒකක ලබාදීම.

# තොරතුරු සන්නිවේදන තාක්ෂණය මගින් ලැබෙන අහිසි විපාක

- මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම.
- සමාජ විරෝධී ක්‍රියා සඳහා යොමුවීම.
- අපචාර සහ අපයෝජනවලට ගොදුරු වීම.
- සෞඛ්‍ය ගැටළු ඇතිවීම.

*තොරතුරු තාක්ෂණ දැනුම ලබාගැනීමේ දී ලංකාවේ සාමාන්‍ය ජනයා මුහුණ දෙන ගැටළු...*

- පිරිවැය අධික වීම.
- භාෂා ගැටළු.
- පරිගණක සාක්ෂරතාව අඩුවීම.
- යටිතල පහසුකම් වල අඩුකම.